# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1985 අංක 3 දරන
# ලියාපදිංචි කළ ස්කන්ධ සහ සුරැකුම්පත් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1985 ජනවාරි මස 09 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1985 ජනවාරි මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 30 යි		තැපැල් ගාස්තුව ශත 60 යි

1985 අංක 3 දරන ලියාපදිංචි කළ ස්කන්ධ හා සුරැකුම්පත් (සංශෝධන) පනත

[සහතික සටහන් කළේ 1985 ජනවාරි මස 09 වන දින.]

එල්. ඩී.—ඕ. 60/83.

ලියාපදිංචි කළ ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1985 අංක 3 දරන ලියාපදිංචි කළ ස්කන්ධ හා සුරැකුම්පත් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. ලියාපදිංචි කළ ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනතේ 30 වන වගන්තියට ඉක්බිතිවම, 30අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුලත් කිරීමෙන්, ඒ ආඥා පනත මෙසින් සංශෝධනය කරනු ලැබේ:— 420 වන අධිකාරයෙහි 30අ වන වගන්තිය ඇතුලත් කිරීම.

"ඒකාබද්ධ ආයෝජන අරමුදලේ ආයෝජන වලින් ලැබෙන ආදායම සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය.

30අ. එසේ වුවද යම් නිදන් අරමුදලක මුදල් (මෙහි මින්මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) ඒකාබද්ධ ආයෝජන අරමුදල මගින් ආයෝජනය කරනු ලැබූ අවස්ථාවක, ඒ ආයෝජනය මත—

(අ) පරිණත වන්නා වූ ණය නිදහස් කිරීමෙහි ලා යම් නිදන් අරමුදලක තැන්පතු පිය වීමේ දී සියලු ගෙවීම් අරමුදලින් ගෙවනු ලැබීමෙන් පසු, අරමුදලට දැනටමත් ලැබී ඇති හෝ උපචිත වන්නා වූ හෝ වුව ද, 1984 ජනවාරි මස 1 වන දින සිට 1984 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ කාල සීමාව තුළ අතිරික්තය සමන් විත වන්නා වූ; සහ

(ආ) 1985 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව අරමුදලට උපචිත වන්නා වූ

සියලු ලාභාංශ, පොලී, ප්‍රසාද දීමනා සහ වෙනත් ලාභ ඒකාබද්ධ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා, "ඒකාබද්ධ ආයෝජන අරමුදල" යන්නෙන්, යම් නිදන් අරමුදලක මුදල් ආයෝජනය සඳහා තැන්පත් කරනු ලබන්නා වූ මුදල් නීති පනතේ 106 (2) වන වගන්තිය ප්‍රකාර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිහිටුවනු ලැබුවා වූ අරමුදල අදහස් වේ.".

ඒ 080172—6,775 (84/11)

**පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.**